# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.09 පැය 0040 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 688 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. පස් කණ්ඩියකට යටවී පුද්ගලයෙකු මියයාම - පැල්මඩුල්ල පොලිස් වසම**

2025.04.08 වන දින සවස් කාලයේ පැල්මඩුල්ල පොලිස් වසමේ බුලත්වැල්ගොඩ ප්‍රදේශයේදී පස් කණ්ඩියකට යටවී පුද්ගලයෙකු මිය ගොස් තවත් පුද්ගලයෙකු තුවාල ලැබීමක් සම්බන්ධයෙන් පැල්මඩුල්ල පොලිස් ස්ථානය විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වන පුටුහපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගොඩනැගිල්ලක් පසු පස බැම්මක් ඉදිකිරිමට පැමිණි පෙදරේරුවෙකු මෙලෙස පස් කණ්ඩියට යටවී මියගොස් ඇති බවටත්, තුවාලකරු එම ගොඩනැගිල්ලේ හිමිකරු බවටත් අනාවරණය වී ඇත.

තුවාලකරු කහවත්ත රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අතර පැල්මඩුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**02. විදුලිසැර වැදී පුද්ගලයෙකු මියගොස් තවත් පුද්ගලයෙකු තුවාල ලැබීම - පන්විල පොලිස් වසම**

2025.04.08 වන දින උදෑසන කාලයේ පන්විල පොලිස් වසමේ කරගස්තැන්න ප්‍රදේශයේදී පුද්ගලයෙකුට විදුලි සැර වැදී මියගොස් තවත් පුද්ගලයෙකු තුවාල ලබා ඇති බවට පන්විල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වන පුටුහපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයා පන්විල කරගස්තැන්න ප්‍රදේශයේ ඉදිකරමින් පවතින නිවසක අත්උදවුකරුවෙකු ලෙස සිටිමින් කම්බියක් ඉහලට එසවීමේදී අසල තිබූ අධිබල විදුලි රැහැනක ස්පශර් වීම හේතුවෙන් මෙලෙස විදුලිසැර වැදී ඇති බවට අනාවරණය වී ඇත.

තුවාලකරු තෙල්දෙණිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අතර පන්විල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගුෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2025.04.08 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කම්බිකොටුව ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2025.04.08 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 50 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 47 ක් වන බඩෝවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිල්ල පොලිස් ස්ථානය.**

2025.04.08 වන දින දහවල් කාලයේ ගිරිල්ල පොලිස් වසමේ මාවතගම ප්‍රදේශයේදී ගිරිල්ල පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 42 ක් වන හුලුගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**